**G.C.E. ORDINARY LEVEL EXAMINATION 2023 (2024)**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2023 (2024)**

**STUDENT SEMINAR SERIES**

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

# Second Language – Sinhala

**දෙවන බස - සිංහල**

**இரண்டாம் மொழி – சிங்களம்**

# QUESTION PAPER – 02

## ප්‍රශ්න පත්‍රය - 02



අනුග්‍රහය

# අධ්‍යාපන අමාත්‍යංශය

දෙවනබස සිංහල – I කොටස

**අ.පො.ස (සා/පෙළ) 2023 (2024) – ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය පැය - 3**

**සැලකිය යුතුයි :**
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

**கவனிக்க வேண்டியவை:**
- சகல வினாக்களுக்கும் விடையளிக்க.
- 1 தொடக்கம் 40 வரையான வினாக்களுக்கு வழங்கப்பட்டுள்ள விடைகளுள் சரியான அல்லது மிகப் பொருத்தமான விடையினைத் தெரிவு செய்க.
- உங்களுக்கு வழங்கப்படும் விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் தரப்பட்டுள்ள வட்டங்களுள் தெரிவுசெய்த விடைக்குப் பொருத்தமான வட்டத்திற்கு புள்ளடி (X) இடவும்

**Instructions**
- Answer **all** questions.
- In each of the questions from **1** to **40**, pick one of the alternatives (1), (2), (3), (4) which is **correct** or **most appropriate.**
- **Mark a cross (X) on the number corresponding to your choice in the answer sheet provided.**

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.
  1 தொடக்கம் 5 வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.
  Select the most suitable pair of word for the word printed in **bold letters** in questions from No.1 to5.

1. ප්‍රවේශ පත්‍ර කලින් වෙන් කරවා **ගන්නෝන.**

   (1) ගන්නවා ඕන (2) ගන්න ඕන (3) ගන්නේ ඕන (4) ගන්නෝ ඕන

2. මෙතැන බස් **නවත්තන්නෑ.**

   (1) නවත්තන්න නෑ (2) නවතින්නේ නෑ (3) නවතන්න නෑ (4) නවත්තන්නේ නෑ

3. ඔයා කොළ කැඳ **බොන්නැද්ද?**

   (1) බොන්නේ නැද්ද? (2) බොනවා නැද්ද? (3) බොන්න නැද්ද? (4) බොන නැද්ද?

4. වැස්සට **තෙමෙන්නෙපා**

(1) තෙමෙන්නේ එපා (2) තෙමෙන්න එපා (3) තෙමන්න එපා (4) තෙමන එපා

5. **සම්බෝලත්තෙක්ක** මඤ්ඤොක්කා කමු.

(1) සම්බෝලත් එක්ක (2) සම්බෝල එකක් (3) සම්බෝල් එකක් (4) සම්බෝලත් එකක්

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරින් **නිවැරදි උච්චාරණය** සහිත උත්තරය තෝරන්න.
  6 தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் விடையைத் தெரிவு செய்க.
  Select the answer with **correct pronunciation** from the words given in questions from No.**6** to **10.**

6. (1) අඹරවමින් (2) අබරවමින් (3) අම්බරවමින් (4) අහරවමින්

7. (1) දිස්තික්කය (2) දිස්තිරික්කය (3) දිස්ත්‍රික්කය (4) ඩිස්ත්‍රික්කය

8. (1) මද්යම (2) මධියම (3) මධ්‍යම (4) මධයාම

9. (1) නැගෙනඉර (2) නැගෙනහිර (3) නැගැනහිර (4) නැගිනහිර

10. (1) කටුල්ල (2) ගඩුල්ල (3) කඩ්ඩුල්ල (4) කඩුල්ල

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශ සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
  **11** தொடக்கம் **14** வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவு செய்க.
  Select the **most appropriate** question for each statement given from No. **11** to **14**.

11. තැපැල් කන්තෝරුව තියෙන්නේ බැංකුව ඉස්සරහා.
    (1) තැපැල් කන්තෝරුවක් තියෙනවා ද ? (2) තැපැල් කන්තෝරුව තියෙන්නේ කොහේ ද ?
    (3) තැපැල් කන්තෝරුවට යන්නේ කොහොම ද ? (4) තැපැල් කන්තෝරුවට යන්නේ කවදා ද ?

12. මේ බෑග් එක නිමල්ගේ.
    (1) මේ බෑග් එක කොහේ ද ? (2) මේ බෑග් එක කීය ද ?
    (3) මේ බෑග් එක කොතන ද ? (4) මේ බෑග් එක කාගේ ද ?

13. ප්‍රදර්ශනය ගැන තොරතුරු රුවන්සිරි මාමාගෙන් දැන ගත්තා.
    (1) ප්‍රදර්ශනය ගැන තොරතුරු දැනගත්තා ද ?
    (2) ප්‍රදර්ශනය ගැන තොරතුරු දන්නවා ද?
    (3) ප්‍රදර්ශනය ගැන තොරතුරු දැන ගත්තේ කාගෙන් ද?
    (4) ප්‍රදර්ශනය ගැන තොරතුරු දැන ගත්තේ කොහෙන් ද?

14. උත්සවය පෙ.ව 10:00ට ආරම්භ වෙනවා.
    (1) උත්සවය ආරම්භ වන්නේ කවුද ? (2) උත්සවය ආරම්භ වන්නේ කීයට ද ?
    (3) උත්සවය ආරම්භ වන්නේ කවදා ද ? (4) උත්සවය ආරම්භ වන්නේ කොහේ ද ?

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදිව අකුරු** යෙදී ඇති උත්තරය තෝරන්න.
  15 தொடக்கம் 17 வரையான வினாக்களில் **சரியான எழுத்துக்கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவு செய்க.
  Select the answer with **correct spelling** in questions No. **15** to **17**.

**15.** (1) නිෂ්පාදනය (2) නිස්පාදනය (3) නිශ්පාදනය (4) නිෂ්පාධණය
**16.** (1) වුර්තිය (2) වෘර්තිය (3) වෘත්ථිය (4) වෘත්තිය
**17.** (1) විද්‍යුත් තැපැල (2) විද්යුත් තැපැල (3) විද්දියුත් තැපැල (4) විදයුත් තැපැල

- අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන පදය** තෝරන්න.
  **18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவுசெய்க.
  Select the **inappropriate** word in question from No. **18** to **20**.

**18.** (1) බෝට්ටුව (2) නැව (3) ලොරිය (4) ඔරුව
**19.** (1) ඇළ (2) පොකුණ (3) ගංගාව (4) දොළ
**20.** (1) වත (2) ශරීරය (3) ගත (4) ඇඟ

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **21** தொடக்கம் **23** வரையான வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்டசொல்லுக்கு **ஒத்தகருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
  Select the **synonym** for the word given at the beginning in questions from No. **21** to **23**.


**21.** ලිපිය : (1) කඩදාසිය (2) ලියුම (3) ලිපිනය (4) ලිත
**22.** විනාශය: (1) වෙහෙස (2) ව්‍යසනය (3) විඳවීම (4) ව්‍යවසාය
**23.** චිත්‍රය : (1) සිතුවම (2) සිතුවිලි (3) විවිධ (4) විචිත්‍ර

- අංක 24 සිට 25 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **24,25** ஆகிய வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **எதிர்க் கருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
  Select the **antonym** for the word given at the beginning in questions No. **24** and **25**.

**24.** සමීප : (1) ළඟ (2) දුරස්ථ (3) කිට්ටුව (4) දිග
**25.** අභ්‍යන්තර: (1) ඇතුළත (2) තුළ (3) බාහිර (4) බැස්ම

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන** අදහස දැක්වෙන වරණය තෝරන්න.
  **26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்டுள்ள படத்துக்கு **மிகப் பொருத்தமான கருத்தைத்** தரும் விடையைத் தெரிவு செய்க.
  Select the option that gives the **most suitable idea** for the picture given in each question from **No. 26 to 28.**

26.



(1) පිරිමි පාර්ශ්වය සඳහා පමණි.
(2) ඉහළ පහළ යාම තහනම්.
(3) විදුලි සෝපානයකි.
(4) පිරිමි අය ඉදිරියට යන්න.

27. 

(1) මිනිස්සු පාරේ වැඩ.
(2) කුණු ඉවත් කරන ස්ථානයකි.
(3) මෙහි කුණු දමන්න එපා.
(4) වැඩට කරන මිනිසා .

28. 

(1) ජංගම දූරකථන තබන ස්ථානයකි.
(2) ජංගම දූරකථන භාවිතයට සුදුසු ය.
(3) ජංගම දූරකථන භාවිත කිරීම තහනම්.
(4) ජංගම දූරකථන අලුත්වැඩියා කරන ස්ථානයකි.

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
  **29,30** ஆகிய வினாக்களுக்குப் **பொருத்தமான விடையைத்** தெரிவு செய்க.
  Select the **suitable answer** for questions No. **29** and **30**.

29. ඊයේ අඟහරුවාදා නම් හෙට කවදා ද?
(1) බදාදා (2) බ්‍රහස්පතින්දා (3) සිකුරාදා (4) සඳුදා

30. ඉර මුදුන් වන වේලාව
(1) අලුයම (2) සවස (3) උදෑසන (4) මධ්‍යාහ්නය

- අංක **31** සහ **32** යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදිව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍ය** තෝරන්න.
  **31,32** ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் சரியாக இணைத்து ஒரு வாக்கியமாக்கி **எழுதப்பட்டுள்ள வாக்கியத்தைத்** தெரிவு செய்க.
  In questions No. **31** and **32**, two sentences each are given. Select the **sentence** that **correctly** combines the two sentences.

**31.** විදුහල්පතිතුමා ශිෂ්‍යනායකයින් කැඳෙව්වේ ය. ඔහු ශ්‍රමදානය පිළිබඳව උපදෙස් දුන්නේය.

(1) විදුහල්පතිතුමා ශිෂ්‍යනායකයින් කැඳවා ශ්‍රමදානය පිළිබඳව උපදෙස් දුන්නේ ය.
(2) විදුහල්පතිතුමා ශිෂ්‍යනායකයින් කැඳවමින් ශ්‍රමදානය පිළිබඳව උපදෙස් දුන්නේ ය.
(3) විදුහල්පතිතුමා ශ්‍රමදානය පිළිබඳව උපදෙස් දී ශිෂ්‍යනායකයින් කැඳෙව්වේ ය.
(4) විදුහල්පතිතුමා ශ්‍රමදානය පිළිබඳව උපදෙස් දෙද්දී ශිෂ්‍යනායකයින් කැඳෙව්වේ ය.

**32.** අජිත් පුවත්පත බලයි. අජිත් සිරස්තල කියවයි.
(1) අජිත් සිරස්තල කියවා ඉන්පසු පුවත්පත බලයි.
(2) අජිත් සිරස්තල කියවීමෙන් පුවත්පත බලයි.
(3) අජිත් පුවත්පත බලමින් සිරස්තල කියවයි.
(4) අජිත් පුවත්පත බලන්න සිරස්තල කියවයි.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු උත්තරය** තෝරන්න.
  **33**, **34**ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவுசெய்க.
  Select the **most suitable answer** to fill in each blank in questions No.**33** and **34**.

**33.** බස් රථවල පාපුවරුවේ ගමන් …………………….. වළකිමු.

(1) කිරීම (2) කිරීමෙන් (3) කිරීමට (4) කිරීම සඳහා

**34.** ඇතුළත …………………….. ගාන්න තීන්ත ලීටර හතරක් ඕනෑ.

(1) බිත්තිවලින් (2) බිත්ති (3) බිත්තියෙන් (4) බිත්තිවලට

- අංක **35.** ප්‍රශ්නයේ **කළු කර** පැහැයෙන් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති පිළිතුර තෝරන්න.
  **35** ஆம் வினாவில் **தடித்த எழுத்திலுள்ள** எண் சரியான எழுத்துக்களால் எழுதப்பட்டுள்ள விடையைத் தெரிவு செய்க.
  Select the answer in which the number in **bold** print has been written in letters correctly in question No. **35**.

**35.** ආහාර පාන මිල දී ගැනීම සඳහා රු. **7034** පමණ වැය වෙයි.

(1) හැත්තෑවයි තිස්හතරක්. (2) හැත්තෑවයි තුනයි හතරක්.

(3) හත්දහස් තිස් හතරක්. (4) හත්දහස් තුනයි හතරක්.

- අංක 36 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයේ ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.
  **36** தொடக்கம் **40** வரையான ஒவ்வொரு வினாவிலும் **இலக்கணரீதியான சரியான** வாக்கியத்தைத் தெரிவுசெய்க.
  Select the **grammatically correct** sentences in each question from No. **36** to **40**.

**36.**
(1) ඔහු සත්වෝද්‍යානය නැරඹීමට යයි.
(2) ඔහු සත්වෝද්‍යානය නැරඹීමට යති.
(3) ඔහු සත්වෝද්‍යානය නැරඹීමට යමි.
(4) ඔහු සත්වෝද්‍යානය නැරඹීමට යමු.

**37.**
(1) මම විභාගයට සූදානම් වෙමු.
(2) මා විභාගයට සූදානම් වෙමි.
(3) මම විභාගයට සූදානම් වෙමි.
(4) මා විභාගයට සූදානම් වෙමු.

**38.**
(1) මෙම මාර්ගයේ බරවාහන ධාවනය වෙයි.
(2) මෙම මාර්ගයේ බරවාහන ධාවනය වෙති.
(3) මෙම මාර්ගයේ බරවාහන ධාවනය වුණා ය.
(4) මෙම මාර්ගයේ බරවාහන ධාවනය වුණෝ ය.

**39.**
(1) අම්මා මල්ලී සමග පොළට ගියෝ ය.
(2) අම්මා මල්ලී සමග පොළට ගියේ ය.
(3) අම්මා මල්ලී සමග පොළට ගියහ.
(4) අම්මා මල්ලී සමග පොළට ගියා ය.

**40.**
(1) අපි ලබන සතියේ විල්පත්තුව නැරඹීමට යන්නේ ය .
(2) අපි ලබන සතියේ විල්පත්තුව නැරඹීමට යනවා ය.
(3) අපි ලබන සතියේ විල්පත්තුව නැරඹීමට යමු.
(4) අපි ලබන සතියේ විල්පත්තුව නැරඹීමට යති.

G.C.E. ORDINARY LEVEL EXAMINATION 2023 (2024)

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2023 (2024)

STUDENT SEMINAR SERIES

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

## Second Language – Sinhala

දෙවන බස - සිංහල

இரண்டாம் மொழி – சிங்களம்

# QUESTION PAPER – II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

**අධ්‍යාපන අමාත්‍යාංශය கல்வி அமைச்சு**

දෙවන බස සිංහල – I, II இரண்டாம் மொழி தமிழ் - I, II

**අ.පො.ස (සා.පෙළ) 2023 (2024)** – ආදර්ශ ප්‍රශ්න පත්‍රය

I කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළු ව II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න.

பகுதி I **இல் 1 ஆம் 2 ஆம்** வினாக்கள் உட்பட பகுதி II இல் **ஒரு** வினாவையும் பகுதி III இல் **இரு** வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக **ஐந்து** வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.

Answer only five questions including questions **1** and **2** in part I and selecting one question from part II and two questions from part III

## දෙවන බස සිංහල – II

### I කොටස / பகுதி I / Part I

1. දී ඇති මාර්ගෝපදේශ ඇසුරු කරගෙන පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන වචන **100ක** පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புகளுள் **ஒன்றைத்** தெரிவு செய்து அதன் கீழே தரப்பட்டுள்ள விடயங்களை அடிப்படையாகக் கொண்டு ஏறத்தாழ **100 சொற்களில்** அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.
Write an essay of about **100 words** on one of the following topics using the given guidelines.

(අ) වන සම්පත ආරක්ෂා කරමු,

(I) වන සම්පත හැඳින්වීම.
(II) වන සම්පත රැකගැනීමේ වැදගත්කම.
(III) වන සම්පත විනාශ වන ආකාරය.
(IV) වන සම්පත රැක ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග.
(V) සමාලෝචනය.

(ආ) පොදු දේපළ රැක ගනිමු,

(I) පොදු දේපළ පිළිබඳ හැඳින්වීම.
(II) පොදු දේපළවලින් ඇති ප්‍රයෝජන.
(III) පොදු දේපළවලට සිදු වන හානි.
(IV) එම හානි වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග.
(V) සමාලෝචනය.

(ඉ) මා දෙවන භාෂා තරගයෙන් ජය ගත් දවස

(I) දෙවන භාෂා තරගයට සූදානම් වූ ආකාරය පැහැදිලි කිරීම
(II) ලබා ගත් තරග අත්දැකීම් .
(III) ජය ගත් අවස්ථාවේ ඇති වූ හැඟීම්.
(IV) මෙවැනි තරග පැවැත්වීමේ වටිනාකම.
(V) සමාලෝචනය.

(ඊ) වැඩිහිටියන් රැකබලා ගැනීම අපේ යුතුකමකි.

(I) වැඩිහිටියන් කවුරුන්දැයි හැඳින්වීම.
(II) වැඩිහිටියන් අද මුහුණ දෙන ගැටලු.
(III) වැඩිහිටියන් රැක බලා ගැනීමේ අගය.
(IV) ඒ වෙනුවෙන් අපට ගත හැකි ක්‍රියාමාර්ග.
(V) සමාලෝචනය.

(උ) මා ගිය බෝට්ටු සවාරිය.

(I) බෝට්ටු සවාරිය සංවිධානය කළ ආකාරය හැඳින්වීම.
(II) සවාරියේ ගමන් මග හා තොරතුරු.
(III) එහි දී විනෝද වූ ආකාරය.
(IV) බෝට්ටු සවාරියේ දී ලබා ගත් අත්දැකීම්.
(V) සමාලෝචනය.

2. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන හතරක්වත් තිබිය යුතු ය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்த பட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.) Compose **five** meaningful sentences with references to the given picture. (There should be at least **four** words in a sentence).



**II කොටස - பகுதி II - Part II**

- අංක **3 හා 4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර සපයන්න.
  **3** ஆம் **4** ஆம் வினாக்களுள் ஏதேனும் **ஒரு** வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
  Answer only **one** question from question No. **3** and **4.**

3. පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
   பின்வரும் கவிதையை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
   Read the following poem and answer the questions given.

මඳ සුළඟක් එන්නේ
ළා දලු සෙලවෙන්නේ
තුරු පෙළ දෙන සිලි සිලි හඬ ඇහිලයි
මගේ සිත පිබිදෙන්නේ

ළා හිරු රැස් වැටුණේ
කුරුලු ගීත නැගුණේ
හිමිදිරියේ හැම තැන සිරියාවයි
මගේ සිත පිබිදෙන්නේ

මල් ගොමු නැළවෙන්නේ
මිහිරි සුවඳ දෙන්නේ
සමනලයන් පැණි බොන හැඩ දැකලයි
මගෙ සිත පිබිදෙන්නේ

සුළඟ ද හිරු රැස් ඒ
ගහ කොළ ඇළ දොළ මේ
කුරුල්ලනේ සමනලයිනි මිතුරනි
ඔබ මට පණ වැන්නේ

(I) මඳ සුළඟට සෙලවෙන්නේ කුමක් ද?
(II) ළා හිරු රැස් වැටුණේ මොන වේලාවේ ද?
(III) මල්ගොමු නැළවෙන විට සිදු වන්නේ කුමක් ද?
(IV) මෙම කවි පන්තියේ සඳහන් වන ජලය ගලා බසින තැන් දෙකකි. ඒවා මොනවා ද?
(V) පද්‍ය පන්තියේ ඇති පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.
   i. මිහිරි –
   ii. මිතුරා -

4. පහත සඳහන් ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
   பின்வரும் உரைப்பகுதியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
   Read the following paragraph and answer the given questions.

වනය සුන්දර තැනකි. එය සිවුපාවුන්, පක්ෂීන්, උරගයින් හා නොයෙක් ගස්වැල් වලින් ද සමන්විත ය. ගලා හැලෙන දිය දහරාවලින් එය තවත් සුන්දර වෙයි. ඒ නිසා වනය කාගේත් සිත් දිනා ගනියි. අඹ, දඹ, වෙරළු ආදිය පමණක් නොව මාදං, හිඹුටු වැනි බොහෝ පලතුරු වර්ග එහි ඇත. අත්තෙන් අත්තට පනින වඳුරන්ගෙන් වනය සෝෂාකාරී වෙයි. වනයේ අසිරිය මෙන් ම ඉන් ලැබෙන ප්‍රයෝජන ද අති විශාල ය. අපගේ දිවිපැවැත්මට අවශ්‍ය ජල සම්පත ලබා දෙන්නේ ද වනය යි. එසේ ම වනය අපට ජීවත්වීමට උපකාරී වන වායුව පිරිසිදු කර දෙයි. වර්ෂාව ලබා දීමට උපකාරී වන්නේ ද වනය යි. ලංකාවේ වනාන්තරවල දිවියා, වලහා වැනි දුර්ලභ ගණයේ සත්තු ද ජීවත් වෙති. සද්දන්තයා හෙවත් අලියා වියළි කලාපීය වනාන්තරවල දක්නට ලැබේ. සිංහයා ලංකාවේ වනාන්තරවල දක්නට නොලැබේ.

(I) වනයේ ජීවත් වන දුර්ලභ ගණයේ සතුන් දෙදෙනෙකු නම් කරන්න.
(II) වනයේ දක්නට ඇති පලතුරු වර්ග දෙකක් ලියන්න.
(III) වනය සෝෂාකාරී වන්නේ ඇයි?
(IV) සද්දන්තයා යනු කවුරුන් ද?
(V) වනයෙන් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

## III කොටස - பகுதி III - Part - III

- අංක **5** හා **6** යන ප්‍රශ්න දෙකට ම උත්තර ලියන්න.
  **5,6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
  Answer both questions No. **5** and **6.**

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන ආරාධනා පත්‍රයක් සකස් කරන්න.
பின்வரும் விடயங்களை கருத்திற்கொண்டு அழைப்பிதழ் ஒன்று தயாரிக்குக.
Prepare an invitation based on the following details.

සෙත්පුර මහානාම විදුහල මගින් සංවිධානය කරන ලද "සිතුවම් හපන්නු" චිත්‍ර තරගයෙන් ජයග්‍රහණය ලැබූ සිසුන්ගේ ත්‍යාග ප්‍රදානෝත්සවයට ආරාධනා කරමින් දෙමාපියන් වෙත යැවීමට ආරාධනා පත්‍රයක් සකස් කරන්න. උත්සවය 2024.10.20 වැනි දින ප.ව 1.00 ට පාසල් ප්‍රධාන ශාලාවේ දී පැවැත්වෙන අතර එදින ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වන්නේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ය. ඔබ කලා සංගමයේ ලේකම් යැයි සිතන්න.

**නැතහොත් / அல்லது / Or**

පහත තොරතුරු ඇතුළත් කොට සුදුසු ලිපියක් සකස් කරන්න.
பின்வரும் விடயங்களை கருத்தில் கொண்டு பொருத்தமான கடிதம் ஒன்று எழுதுக.
Based on the following facts write an official letter.

දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශවාසීන්ගේ ජීවිතවලට මෙන් ම වගා කටයුතුවලට ද වනඅලින් ගෙන් බාධා පැමිණෙයි. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ද සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා කටයුතුවලට ද මේ මඟින් එල්ල වන්නේ විශාල තර්ජනයකි. අනුරාධපුර ජයබිම ග්‍රාමයේ යොවුන් සමාජයේ ලේකම් ඔබ යැයි සිතා මෙම බාධා මැඩ පැවැත්වීම උදෙසා කඩිනම් පියවරක් ගන්නා මෙන් ප්‍රාදේශිය ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කළයුතු ව ඇත.

6. පහත දැක්වෙන දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் அல்லது ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழிபெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala.**

(I) கிராமசேவக உத்தியோகத்தர் அறிவுறுத்தல் வழங்கினார்.
The Grama Niladhari instructed.

(II) முன்னால் உள்ள சந்தியால் இடது பக்கம் திரும்புங்கள்.
Take left from the next junction.

(III) தயவுசெய்து எனக்கு நோயாளியின் பெயரை கூறுங்கள்.
Please let me know the name of the patient.

(IV) நாம் சுத்தமான நீரை அருந்துவோம்.
Let us drink clean water.

(V) செய்திகளை செவிமடுத்து விடயங்களை சேகரித்துக் கொள்வோம்.
Listen to the news and collect information.

**නැතහොත්**
**அல்லது**
**Or**

පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන සංවාදයක් ලියන්න. (වාක්‍ය 10ක් ප්‍රමාණවත් වේ.)
பின்வரும் தகவல்களை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்று எழுதுக. (10வாக்கியங்கள் போதுமானது)
Write a dialogue based on the following information. (10 sentences are enough.)

පාසලේ චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා කලා සංගමයේ ශිෂ්‍යයින් හා චිත්‍ර ගුරුතුමිය අතර පැවැත්වෙන සංවාදය ලියන්න. ඒ සඳහා පහත කරුණු උපයෝගී කරගන්න.

- ගුරුතුමිය සමග ආචාරශීලී ව සාකච්ඡාව ඇරඹීම
- යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම
- සමුගැනීම.